# තාක්ෂණික ලිබරල්කරණය තුළින් ගොඩනැගෙන ඩිජිටල් මානව විද්‍යාවෙහි සමාජ සහ සංස්කෘතික එළඹුමෙහි අද්‍යතන ප්‍රවනතා

**ආචාර්ය ධර්මකීර්ති ශ්‍රී රන්ජන්**

අංශාධිපති (වැ.බ.)

ජනමාධ්‍ය අධ්‍යයන අංශය

ශ්‍රීපාලි මණ්ඩපය - කොළඹ විශ්වවිද්‍යාලය.

අද්‍යතන මාධ්‍ය මානව විද්‍යාවෙහි (Media Anthropology) එක් ප්‍රබලතම විෂය කොටසක් ලෙස ඩිජිටල් මානව විද්‍යාව (Digital Anthropology) නැමැති උප විෂය (Sub-discipline) සැලකිය හැකි වේ. මානව විද්‍යාව සමාජීය විද්‍යා (Social sciences) විෂය ක්ෂේත්‍ර තුළ මිනිසාගේ භෞතික මෙන්ම සමාජීය සහ සංස්කෘතික ක්‍රියා සහ අන්තර් ක්‍රියා (Action and interaction) පිළිබඳව ප්‍රබලතම විෂය ශික්ෂණය බවට පත් වේ. අද්‍යතන විශ්ව ගම්මාන කේන්ද්‍රීය මිනිසා ස්වකීය සංස්කෘතියෙහි ඩිජිටල්කරණය (Digitalization of the culture) පමණක් නොව විඥනික ශ්‍රව්‍ය දෘශ්‍ය, මතවාදී මෙන්ම දෘෂ්ටිවාදී කාරණාවන් ද ඩිජිටල් තාක්ෂණික ස්වරූප පදනම් කරගෙන ගොඩනැගෙන ආකාරය මින් පෙර සිදු නොවූ ලෙස අවබෝධ කොටගත හැකි ය. අද්‍යතන ඩිජිටල් තාක්ෂණික ක්‍රමවේදය සන්නිවේදනය සහ එහි පණිවුඩ ක්‍රියාවලිය ලෝකයෙහි භූගෝලීය සීමාවන් ද අතික්‍රමණය කරමින් මානව සමාජය තුළ මිනිසා මෙහෙයවීමේ ප්‍රබල සංරචකය බවට පත් වී තිබේ. මෙය සරල සංකල්පීය කාරණාවන් ඔස්සේ අවබෝධ කර ගැනීම දුෂ්කර වනු ඇත. එතරම්ම මෙම සන්නිවේදන තාක්ෂණික ක්‍රියාවලිය මිනිසා සහ සමාජයෙහි චර්යාත්මක පද්ධතිය සංකීර්ණ කොට මාර්ග ගත ජීවිතයකට (Online life) පුද්ගලයා අවතීර්ණ කොට තිබේ (Cool, 2012). එමෙන්ම මෙම මාර්ග ගත ක්‍රමවේද මගින් විද්‍යුත් ගෝත්‍රික කරණය හෙවත් විද්‍යුත් පෙළපත් (Electronic tribes) නිර්මාණකරණය ද ගොඩනැගී ඇති අතර තව ද එය වේගයෙන් වර්ධනය වෙමින් පවතී. මෙම සංකල්පය සංවර්ධනය වන්නේ වසර දශක දෙකක පමණ කාලයක් ඔස්සේ බව පැහැදිලි ය. ඉතිහාසයෙහි සමාජ පෙළපත් කාරණය ගොඩනැගුණේ සලෝහිතතාව හෙවත් සගෝත්‍රතාව (Consanguinity), භෞමික හෙවත් දේශභූමික සබැඳියාව (Territorial contiguity) සංස්කෘතික විශේෂීතාව (Cultural singularities) ආදිය පදනම් කොට ගනිමිනි (Adams & Smith, 2008). මෙම සබැඳියාවන් ගොඩනැගෙන්නේ හුදෙක් මනෝරාජික සහ මනෝරාජික නොවන ආකෘතිකකරණයන් (Utopian and dystopian formations) පාදක කොටගෙන බව පැහැදිලි ය.

එහෙත් මෙහිදී හුදෙක් විද්‍යුත් තැපෑල (E-mails) මුහුණු පොත (Facebook) සහ එහි සමූහ සහ විවිධ ක්‍රීඩා සමූහ (MMORPG i.e. 'Massively multiplayer online role-playing game') ආදිය මගින් වර්තමාන විද්‍යුත් පෙළපත නිර්මාණය වීමට අදාළ පාදකය ගොඩ නැගිය හැකි ය. මෙහිදී බොහෝ දුරට

විද්‍යුත් පෙළපත් සාමාජිකත්වය ද (E-tribe members) ගොඩ නැගෙන ආකාරය පැහැදිලි ය. මේ තුළ පුද්ගලයා ප්‍රතිසමාජානුයෝජනයකට ද (Re-socialization) ලක් වන ආකාරය විද්‍යමාන වේ. මෙම විද්‍යුත් ක්‍රමවේදීය එළඹුම් තුළ ගොඩනැගෙන්නන් හුදෙක් සංස්කෘතික සීමා සහ ජාතික සීමාවන් (Cultural and national borders) අතික්‍රමණය කරන අතර එය සමාජයෙහි වේගවත් වෙනස සඳහා ප්‍රබල ලෙස බලපාන බව පැහැදිලි කරගත යුතුය. මෙම තාක්ෂණික දියුණුව මගින් මානව ජීවිතයෙහි සහ සංස්කෘතියෙහි සිදු කරන වෙනස පිළිබඳව මානව විද්‍යාත්මක පර්යාවලෝකනයකින් (Anthropological perspective) ගොඩනගන අවබෝධය හුදෙක් වැදගත් වන්නේ යථාර්ථය ගවේෂණ කාර්යට ද එය ප්‍රබල ලෙස හේතුවන බැවිනි.

ඩිජිටල් තාක්ෂණය සහ එහි අන්තර්ගත මානව කාරණා හුදෙක් පර්යන්තීය ප්‍රජාව සමජාතික ස්වරූපයකට (Homogenization) කේන්ද්‍ර ගත කිරීමක් ද මෙහිදී දැකිය හැකි වේ. එමෙන්ම ඩිජිටල් ලෝකයෙහි භෞතික කාරණාවන් වෙන කිසිවකටත් වඩා මිනිසා මෙහෙයවන ධාවක බලවේගය බවට පත් වෙමින් තිබෙන ආකාරය පැහැදිලි ය. මෙහි සුවිශේෂීතම ලක්ෂණය බවට පත් වන්නේ අඩු මිනිසුන්ගේ ඒකරාශිකරණයත් (Less human), විශ්වසනීයත්වයෙහි අඩු බවත් (less authenticity) මෙන්ම මිනිසා ප්‍රබල මාධ්‍ය කරණයකට (More mediated) කේන්ද්‍රගත වීමත් ය. ඒ අනුව මෙම තාක්ෂණය සමාජය මෙහෙයවන ප්‍රබල යාන්ත්‍රණය බවට පත් වෙමින් තිබෙනවා පමණක් නොව පැවැති පුද්ගල සහ සමාජ ප්‍රතිමානික කාරණාවන් (Social normative factors) වෙනුවට නව ප්‍රතිමානික කාරණාවන්ගේ ආරෝපණය ද (Re-impose) ගොඩ නැගෙමින් තිබෙනු පැහැදිලි ය.

එමගින් මිනිසාගේ සමාජ සංස්කෘතික කාරණා (Socio-cultural factors) පමණක් නොව ඩිජිටල් තාක්ෂණය වර්ධනය කිරීමත් සමගින් වෙනස්වන ජනගහනයෙහි චර්යාත්මක සාධක සහ එහි ප්‍රතිඵල සහ අතථ්‍ය මෙන්ම තථ්‍යාසන්න යථාර්ථයකට (Virtual reality) පුද්ගලයා සහ සමාජය හැඩ ගස්වන්නේ කෙසේ ද යන්න පිළිබඳවත් මානව විද්‍යාත්මක ක්‍රමවේද තුළ අධ්‍යයනය කිරීමේ හැකියාව තිබෙන බවත්, මානව විද්‍යාත්මක ක්‍රමවේද තුළ මෙම තාක්ෂණය භාවිතා කිරීමේ ක්‍රම සහ ඩිජිටල් තාක්ෂණය (Digital technology) තාක්ෂණික මිනිසෙකු (Homo technicus) නිෂ්පාදනය කරන්නේ කෙසේ ද යන්න පිළිබඳවත්, මිනිසාගේ වෙනස්වීම සංවර්ධනය සඳහා මෙන්ම මිනිසා වෙනස් විය යුත්තේ කෙසේ ද යන්න පිළිබඳවත් ක්‍රමවේදාත්මකව (Methodologically) අධ්‍යයනය කිරීම මෙහි විෂය ක්ෂේත්‍රයෙහි ප්‍රබල කොටස් බවට පත් වේ.

මෙම විෂය කොටස මගින් සමකාලීන මානව විද්‍යාවෙහි (Contemporary Anthropology) ස්වභාවය සහ එහි වර්ධනය පිළිබඳව ද පුළුල්ව ප්‍රශ්න කළ හැකි ය. තාක්ෂණය මගින් ජනගහනයට සිදුවන බලපෑම පමණක් නොව ජනගහනය මගින් තාක්ෂණය සහ එහි ස්වරූප ගොඩනගන ආකාරය පිළිබඳව ද සාකච්ඡා කළ හැකි ය. නූතන මාධ්‍ය සහ ජනගහනය (Modern Media and population) මෙන්ම නවමාධ්‍ය (New Media) පමණක් නොව සමාජ මාධ්‍ය සහ ජනගහනය (Social Media and population), එහි

වෙනස් වීම පිළිබඳව ද ගොඩනගන දෘෂ්ටිය මානව විද්‍යාත්මක විෂයෙන් ඉවත් වුවහොත් එහි අර්ථ නිසි ලෙස ජනනය නොවනු ඇත (Pink *et al.* 2016). ඩිජිටල් තාක්ෂණය සාමාන්‍ය තක්සේරුවකට කේන්ද්‍රගත කළ නොහැකි වන්නේ එය සමස්ත මානව චර්යාත්මක පද්ධති පමණක් නොව විශ්‍ලේෂණයක කාරණාවන්ට ද ප්‍රබල ලෙස බලපෑම් කරමින් මානව චර්යාවේ දිශානතිය වෙනස් කිරීමේ ශක්‍යතාව එයට පවතින බැවිනි (Geismar, 2018). ඩිජිටල් තාක්ෂණය භාවිතා කිරීමේ ක්‍රමය ද මානව විද්‍යාත්මක ක්‍රමවේදයෙන් බැහැර නොවන බැවින් මනුෂ්‍යත්වය වෙනස් වීමේ ගැටලුව පිළිබඳ ඇඟ වීම ද අධ්‍යයනය කිරීම මෙහිදී සිදු වේ (Coleman 2010).

සංඛ්‍යාංක තාක්‍ෂණික ක්‍රමවේදය (Digit technology) යනු අද්‍යතන තාක්ෂණික දියුණුවෙහි උපරි ප්‍රතිඵලයක් ලෙසින් සන්නිවේදනය හා සබැදෙන ආකාරය පැහැදිලි වන අතර ඒ තුළින් විද්‍යුත් ලෙසින් ගොඩනැගෙන අන්තර් ක්‍රියාව පමණක් නොව පෞද්ගලිකත්වයෙහි බිඳ වැටීම ද (De-individuation) දැකිය හැකි ය. මේ තුළ සන්නිවේදනයෙහි නව දිශානති පමණක් නොව මානව චර්යාත්මක ගතිකයන් ගේ (Human behavioral dynamics) වෙනස් වීම පිළිබඳ පුළුල් අධ්‍යයන ප්‍රවේශයකට කේන්ද්‍රගත විය හැකි වන්නේ මානව වංශ ශාස්ත්‍රය සාකල්‍ය ප්‍රවේශයක් (Holistic approach) තුළ කේන්ද්‍රගත වන්නේ නම් පමණි. අනෙක් අතට සංඛ්‍යාංක විද්‍යාත්මක ක්‍රමවේදය ප්‍රබල ලෙසින් ම අද්‍යතන මානව විද්‍යාත්මක ක්‍රමවේදයට (Anthropological methodology) බලපෑම් (Impact) සිදු කොට තිබේ. මෙම ඩිජිටල් තාක්ෂණික ක්‍රමය මිනිසාගේ කාලය අවකාශය (Time and space) සහ වැඩ කිරීමේ ක්‍රියාවලියට (Working practices) පමණක් නොව මානව මානසික ක්‍රියාවලියට ද සිදු කොට ඇති බලපෑම් සරල නොවන බව පැහැදිලි වන්නේ ඒ පිළිබද විද්‍යාත්මක අවබෝධය ඇත්නම් පමණි. අනෙක් අතට කාලය යන්න කිසිදින මිනිසාට අතික්‍රමණය කිරීමේ හැකියාවක් ද නොමැති වන බව පැහැදිලි කරගත යුතු ය. මිනිසාට හැකි වන්නේ කාලය යන්නට අවනත වීම පමණි. මේ අනුව මිනිසාගේ ආත්මීය ස්වරූපයන් සුහුරු දුරකථනයට (Smart phone) පැවරීමත් සමගින් කෘත්‍රිම බුද්ධියට (Artificial intelligence) අනුගත වීම පමණක් නොව ශ්‍රමයෙහි හැඩරුව වෙනස් කිරීමේ කාරණාව පමණක් ද නොව පුද්ගලයාව හුදු දත්ත වලට සීමා කිරීමට (Limited to mere data or 'datafication') ද හැකි වී තිබේ. එමෙන්ම දුර දිග සම්බන්ධිතයන්ගේ (Long-distance intimacy) පුද්ගල අවශ්‍යතා තෘප්තිය ද මේ තුළ ගොඩනැගීම දැකිය හැකි වේ. ඩිජිටල් තාක්ෂණික කාරණාව මාතෘ භාවයෙහි හෙවත් මව්කමෙහි ද පාරජාතික ස්වරූපයන් (Transnational motherhood) නිර්මාණය කොට ඇති බව ද පැහැදිලි කර ගත හැකි වේ (Madianou & Miller 2012).

සංඛ්‍යාංක මානව විද්‍යා විෂය ක්ෂේත්‍රය තුළ ගොඩනැගෙන අර්ථ නිරූපණ සරල නොවන්නේ සමාජය තුළ වෙනස් වන මානව චර්යාත්මක කාරණාවන් ධර්මතා සහ ආචාර විද්‍යාත්මක ක්‍රමවේද (Normative and ethical arguments) ඔස්සේ ගොඩනැගීමට අදාළ නිවැරදි මානව මෙහෙයවීම සංවර්ධනය අරමුණු කරගෙන සිදුවන්නේ නම් පමණි. එහෙත් වර්තමානය තුළ මෙම මානව විද්‍යාත්මක දැනුම් පවතින සිද්ධි නිරීක්ෂණයට පමණ සීමා වීම තුළ ගොඩ නැගෙන සිද්ධි විශ්ලේෂණය දැකිය හැකි වේ. එහෙත් සිදු විය යුත්තේ සිද්ධිය ගොඩනංවන හේතු විවරණ ගොඩනැගීම තුළ හේතු කළමණාකරනය

කිරීමකි. එහෙත් මෙය  අද්‍යතනයෙහි බොහෝ ශාස්ත්‍රාලයීය ගවේෂණ කාර්යන්ගෙන් සහ ප්‍රතිපත්ති සහ සැලසුම් ක්‍රමවේද තුළ ද සිදු නොවීම දැකිය හැකි ය. ඒ අනුව සිද්ධි විවරණය වීමට අදාළ පරිසරය වර්තමාන සංවර්ධන ව්‍යාපෘති තුළ ද කේන්ද්‍රගත වන ආකාරය පැහැදිලි ය. සංඛ්‍යාංක තාක්ෂණික මෙවලම් ලෝකය වේගවත් කොට තිබෙන (Speed up the world) අතර වේගය නිරන්තරයෙන් මිනිසාගේ චර්යාත්මක වේගය බවට  පත් වී තිබේ.  මෙය ලෝකය වෙනස් කිරීමේ ගමන් පථය (Trajectories of change) බවට පත් වී තිබේ (Horst & Miller 2012). එම නිසා මානව වංශවේදය සමාජ පද්ධතික ව්‍යුහය තුළට (Structure of social system) කේන්ද්‍රගත වෙමින් පද්ධතික විශ්ලේෂණ (System analysis) ගොඩනැංවීම හෙවත් සංයෝජන (Constructions) පදාර්ථ පමණක් නොව විසංයෝජන ක්‍රමවේද (De-construction method) පිළිබඳව ද ගොඩනගන විෂයානුබද්ධ එළඹුම සමාජීය ක්‍රියාවලියෙහි ප්‍රගමනය සඳහා හේතු වනු ඇත.

අද්‍යතන ලෝකයෙහි තාක්ෂණික ලිබරල් වාදය (Techno-liberalism) දැකිය හැකි අතර එය ඓතිහාසිකව ගොඩනැගුනු ප්‍රබන්ධයන්ගෙන් වියුක්ත වූවක් නොවන බව පැහැදිලි වන්නේ ද නවීකරණය පිළිබද පාර දේශනාවන්ගේ (Meta-discourse of modernity) ස්වරූප අවබෝධ කරගන්නා විට ය. මෙම තාක්ෂණික ව්‍යාපෘතිකකරණය ලෝක යථාර්ථය හා විඥානය අතර ගොඩනැගෙන සබඳතාව පරස්පර විරෝධී ක්‍රියාවලියක් බවට පත් කොට ඇති බව මෙම තාක්ෂණික සහ මානව ක්‍රමවේදය තුළ ගොඩනැගෙන අපෝහක ක්‍රියාවලි (Dialectic process) මගින් අවබෝධ කරගත හැකි වේ. එහෙත් හේගලියානු තර්කණාත්මක න්‍යායන්ට (Dialectical theories of Hegel) අනුව පැහැදිලි කරගත හැකි වන්නේ සමකාලීන ලෝකය තුළ ගොඩනැගෙන මෙම පුද්ගලාන්තර සහ සමාජ සබඳතා එකිනෙකා මත යැපීමේ ක්‍රියාවලියක් මිස (Dependent upon each other) එකිනෙකාට ප්‍රතිවිරුද්ධ වීමේ ක්‍රියාවලියක් බවට පත් නොවන එකක් බවයි. එහෙත් මාක්ස් (Karl Heinrich Marx, 1818 – 1883),  සිමෙල් (Georg Simmel, 1858 - 1918) සහ fප්‍රැන්ක් fපර්ට් ගුරු කුලයෙහි (Frankfurt school) න්‍යායාත්මක එළඹුම් තුළින් පැහැදිලි වන්නේ වාණිජ වටිනාකම්  සහ  එය මත පදනම් වූ  භෞතිකය මානව වාදයට තර්ජනයක්  (Threat to humanity) වන බවයි.  මුදල් යනු ද අතථ්‍ය ක්‍රියාවලියක් මත (Virtual degree) පදනම් වූවකි. එහි හුවමාරුව මුහුණට මුහුණ සිදුවන අතර (Face-to-face transaction) එහිදී සමතාව ගණනය (Equivalence), සංඛ්‍යාත්මක හෙවත් ප්‍රමාණාත්මක  (Calculation and the quantitative) බව ආදිය කෙරෙහි මූලිකත්වය දෙනු ලබන අතර එහි ගුණාත්මක නොවන බව මානව වාදයට එරෙහි වීමක් බව මෙම න්‍යායාත්මක එළඹුම් තුළින් පැහැදිලි වේ. වර්තමානයෙහි ඩිජිටල් තාක්ෂණය තුළ මෙය දුර සිට සිදුවන ක්‍රියාවලියක් බවට ද  පත් වේ. මෙම අතථ්‍ය භාණ්ඩ (Virtual properties) සහ එහි ක්‍රමවේදී බව භෞමික ප්‍රදේශ ද අතික්‍රමණය කරමින් වඩාත් කාර්යක්ෂම වන්නේ තොරතුරු සහ සන්නිවේදනයෙහි  ස්වභාවය සහ එහි වේගවත් බව පදනම්ව බව පැහැදිලි ය (Hart, 2000; 2005; 2007). මෙම සමකාලීන ඩිජිටල් තාක්ෂණික ප්‍රවාහය මගින් බොහෝ චර්යා සහ සංස්කෘතික ස්වරූප නිෂ්පාදනය (Too much cultures) කරන අතර ඒවා මතුපිට ව්‍යුහයන්

(Superficial) හෙවත් නොගැඹුරු (Shallow) බවට පමණක් නොව පුද්ගලයා සහ සමාජ ක්‍රමවේදය අන්සතු කරණයකට (Alienation) ද ලක් කරන ස්වරූප දැකිය හැකි වේ.

වර්තමානයෙහි මිනිසුන් රූපවාහිනියට වඩා මුහුණු පොතට සම්බන්ධතා ගොඩනැගීම් තුළ නිසැකවම විශ්වසනීයත්වය අඩු (Lack of authenticity) සත්‍ය සමාජභාවය අවසන් කළ ක්‍රමවේදයකට (End of true sociality) සමාජය අවතීර්ණ වන බව පැහැදිලි වේ (Spiegel, 1992). මෙම සමාජ ගොඩනැගීම් පවතින මානව විද්‍යාත්මක න්‍යායන්ට පරිබාහිර බවට පත්වන්නේ ද සෑම මිනිසෙකුම සංස්කෘතිය හා සමපාත වන බවත් එය වාස්තවික ක්‍රියාවලියක් බවත් (Products of objectification) ඒ තුළින් පැහැදිලි කර ගන්නා විට ය. එය අද්‍යතනයෙහි ඩිජිටල් අතථ්‍ය සමාජ ව්‍යුහයන් තුළින් සමාජ භාවිතයන් ට අදාළ මෙහෙයවීම (Virtual structures guide social engagement) සිදුවන බැව් පැහැදිලි කරන බැවිනි (Munn, 1973; Myers, 1986).

අනෙක් අතට සංස්කෘතිය පිළිබඳ වඩාත් ශක්තිමත් ලෙස කියවීම් තුළින් මානව විද්‍යාඥයාගේ කාර්ය පමණක් නොව චින්තන සහ එයට පාදක ක්‍රියාමාර්ග පිළිබඳව ද විමසිය හැකි වේ. අද්‍යතන මානව විද්‍යාව මගින් මිනිසාගේ විවිධ චින්තන ක්‍රමවේද සහ එයට පාදක ක්‍රියාවලිය පිළිබඳ ගැඹුරු විමසීම් සිදු නොවන බව පැහැදිලි ය. ඥානමීමාංසාත්මක මූලිකාංගයන් ගෙන් (Epistemological grounding) සහ නියතත්ත්වයන් ගෙන් (Certainty) වියුක්ත වීම තුළ මානව විද්‍යාවෙහි විචාරාත්මක එළඹුම් (Critical appraisals) අහිමි වී ඇති බව පැහැදිලි පෙනේ (Fabian 1991).

අද්‍යතන පශ්චාත් ගෝලීයකරණ සමාජ ක්‍රමවේදය තුළ ව්‍යුහගත වන මානව ක්‍රියාවලිය (Human process) සරල අර්ථ නිෂ්පාදනය කරන්නකට වඩා වේගයෙන් අර්ථ ව්‍යාප්ත කරලීමට අදාළ තාක්ෂණික මෙවලම් සහ එහි විධික්‍රම භාවිතයට ගන්නා යුගයක් ලෙස තේරුම් ගැනීම වැදගත් වේ. එය මානව විද්‍යාවට (Anthropology) පමණක් නොව සමස්ත සමාජීය (Social sciences), භෞතික (Physical sciences) සහ ස්වභාවික විද්‍යාවන්ට (Natural sciences) වැදගත් වන්නේ මෙම සියලුම විද්‍යාවන් මානව චර්යාත්ම ගතිකයන්ගෙන් වියුක්ත නොවන නිසා ය. ඒ අනුව මාධ්‍ය සහ සන්නිවේදනය යනු එකිනෙකින් වියුක්ත නොවන ප්‍රබල ඓන්ද්‍රීය සබඳතා තුළ ව්‍යුහගත වන ද්‍රව්‍ය මූලික (Materialistic) සහ මනෝ මූලික (Idealistic) ලෙස සංයුක්ත වූ ප්‍රවාහයන් දෙකක් බව පැහැදිලි ය.

සන්නිවේදනයෙහි තවද එක් ප්‍රබලතම කාර්යභාරයක් වන්නේ 'පැහැදිලි කිරීම්' සහ 'තේරුම් ගැනීම්' යන්න යි. පැහැදිලි කිරීම සහ තේරුම් ගැනීම යනු ප්‍රබල ප්‍රභේද දෙකකි. මෙය දාර්ශනික ක්‍රමවේදයට අන්තර්ගත වුවත් සියලු විද්‍යාවන්ට මෙයින් වියුක්ත වීමේ ශක්‍යතාවක් නොමැති බව පැහැදිලි ය. මේ පිළිබඳ දහනව වන සියවසෙහි අන්තිම දශකයෙහි යුරෝපය තුළ විවාද හටගත්තත් ඊට පෙර ආසියානු සංකල්පය තුළ ක්‍රි. පූ. යුග ගණන් වල සිට එහි ක්‍රමවේද ගොඩනැගුණු බව පැහැදිලි ය. ස්වභාවික විද්‍යාඥයින් (Natural scientists) නිරන්තර ගොඩනැගුණේ පැහැදිලි කිරීම් යන්න ඥාන සම්පාදනයෙහි ප්‍රබල කරුණක් ලෙස සලකමිනි. එහෙත් සමාජීය විද්‍යා විෂය ක්ෂේත්‍ර පාදකව ගොඩනැගෙන

ඥානමීමංසාව මූලික කාරණාවක් ලෙස තේරුම් ගැනීම හෙවත් අවබෝධ කර ගැනීම යන්න කේන්ද්‍ර කොට ගත් ආකාරය දැකිය හැකි වේ. සමාජ විද්‍යාව විෂය තුළ ගොඩනැගෙන ඥානමීමංසාත්මක පමණක් නොව ප්‍රත්‍යක්ෂ මූලවාදී විධික්‍රමයට ද එය අභියෝගයක් වූ බව පැහැදිලි ය. මේ පිළිබඳව සන්නිවේදන විෂය තුළ පමනක් නොව මානව විද්‍යා විෂය ක්ෂේත්‍රය තුළ ද ප්‍රබල කතිකාවක් ගොඩනැගිය යුතු වේ.

මෙහිදී ඉන්ද්‍රීය අත්දැකීම් ප්‍රමුඛ කර ගැනීම සහ එමඟින් නිර්මාණය වන තර්කන විධි සහ විශ්ලේෂණ ක්‍රම තුළ ගොඩනැගෙන ඥානය යනු ද සන්නිවේදන විභවතාවෙහි ප්‍රතිඵල ලෙස හඳුනාගත හැකි ය. ලොව විවිධ දාර්ශනිකයන් සහ දර්ශනයන් ලෝකය පිළිබඳව විවරණ ගොඩ නැගුවත් සන්නිවේදනයෙහි ප්‍රමුඛාර්ථය බවට පත්වන්නේ වෙනස යන්න නිර්මාණය කිරීම ය. සන්නිවේදනය තුළ අර්ථය යන්න කේන්ද්‍රගත වන අතර එහි ප්‍රමුඛාර්ථය බවට පත්වන්නේ ද වෙනස යන්න ය. මනසේ බිහිවන සංකල්ප ඇත්තටම ද්‍රව්‍යමය ලෝකය පාදකව නිෂ්පාදනය කරන්නක් බව පැහැදිලි වන්නේ මාධ්‍ය සහ සන්නිවේදනයෙහි ප්‍රබල බව ප්‍රත්‍යක්ෂ කරගත් විඥානයක ට පමණි. විඥානය සකස් කරන්නේ ම සන්නිවේදනය මගින් වන අතර එයට සමාජ යථාර්ථය තේරුම් ගැනීමට පමණක් නොව එය ප්‍රතිනිෂ්පාදනය කිරීමේ හැකියාව ද පවතින්නක් බව තේරුම් ගත හැකි වන්නේ සමස්තය පිළිබඳ දයලෙක්තික සංකල්පයට කේන්ද්‍රගත වන විට ය. ඒ අනුව සමස්තය යන්න ඒකකයට වඩා ප්‍රබල වන අතර එය යථාර්ථය විඥානය තුළ හැඩගස්වන ප්‍රභේදය බවට ද පත් වනු දැකිය වේ. එය සන්නිවේදනයෙහි සහ මාධ්‍යයෙහි ප්‍රතිඵලය යි.

සන්නිවේදනයට සහ එහි කේන්ද්‍ර ගතවන අර්ථ ස්වාධීන වූ යථාර්ථයක් මත ගොඩනැගෙන්නේ ද යනු ගැටලුවකි. නමුත් වාස්තවික යථාර්ථය සමාජ ලෝකවල පවතී. මෙය උකහා ගැනීමට නම් සන්නිවේදනයෙහි යථාර්ථය එහි අර්ථ තුළ ප්‍රමුඛ කරගත යුතු වේ. යථාර්ථය යනු අවබෝධ කළ හැකි ප්‍රපංචයක් (Phenomenon) වුව ද එය මිනිසාට පහසුවෙන් ඥානනය කළ නොහැකි අයුරින් අර්ථ පද්ධති තුළ සංකීර්ණ කොට තිබේ. ඒ තුළ යථාර්ථය විකෘති කර පෙන්වන විවිධ දෘෂ්ටිවාද ගොඩනැගීම සිදුවන අතර එය සමාජ සංවර්ධන සංරෝධක බවට ද පත් වේ. යථාර්ථය වෙනස් කිරීමේ කර්තෘත්වය මිනිසාට නොමැති අතර එය අවබෝධ කරගැනීමේ කර්තෘත්වය මිනිසාට කේන්ද්‍රගත කරවනු ලබන්නේ සන්නිවේදන විභවතා මගින් බව පැහැදිලි ය.

සන්නිවේදනය සහ මාධ්‍ය යන්න පිළිබඳ සාම්ප්‍රදායික තේරුම් ගැනීම ප්‍රමාණවත් නොවන බව පැහැදිලි කරගත යුත්තේ එය සංස්කෘතික මෙවලම් බවට පමණක් පත් නොවන බැවිනි. එක් පුද්ගලයෙකුගෙන් තවත් පුද්ගලයෙකුට, එක් ප්‍රජාවකින් තවත් ප්‍රජාවකට වටිනාකම්, විශ්වාස, අර්ථ සහ අත්දැකීම් පමණක් නොව අර්ථ බෙදාගන්නා ප්‍රධානතම මෙවලම් බවට පත්වන්නේ සන්නිවේදනය සහ මාධ්‍යය යි. අර්ථයෙහි උරුමය නිරන්තරයෙන්ම ගොඩ නගා ගනු ලබන්නේ ඉතිහාසය සහ සංස්කෘතිය විසිනි. ඒ අනුව සමාජයෙහි පැවැත්ම පිළිබඳ තේරුම් ගැනීමට නම් එම පැවැත්මේ ව්‍යුහයන් පිළිබඳ අවබෝධ කර ගැනීම අත්‍යවශ්‍ය වන අතර එය අනෙක් අතට සංස්කෘතිය පිළිබඳ පමණක් නොව එහි ඉතිහාසය පිළිබඳ කියවීම් බවට ද පත්ව වනු ඇත. ඒ අනුව මනුෂ්‍ය පැවැත්ම පමණක් නොව සන්නිවේදනයට අදාළ අර්ථ ද ඓතිහාසිකත්වය තුළ නිශ්පාදනය වන්නකි. සන්නිවේදනය සහ මාධ්‍ය

යන්න හුදෙකලාව වාස්තවික හෝ හුදෙකලා මනෝ මූලිකත්වය තුළ සිදුකරන තේරුම් ගැනීමක් පමණක් බවට ද පත් නොවිය යුතු ය. තේරුම් ගැනීම යන්න සන්නිවේදනයෙහි සහ මාධ්‍යයෙහි ප්‍රතිඵලයකින් තොරව සිදුවිය නොහැකි අතර එය අන්තර් විෂයීක (Inter disciplinary) අර්ථ දීපනයක ක්‍රියාකාරීත්වය බවට ද පත් වනු ඇත. නිදසුන් ලෙස පඨිතය යන්න විෂය මූලික සහ වාස්තවික අර්ථ තුළින් නිෂ්පාදනය වන්නක් බවට පත් වේ. කර්තෘ මූලික සහ මනෝමූල විෂය අභිලාෂයන්ට (Subjective intervention) අමතරව සන්නිවේදනය තුළ අර්ථ නිෂ්පාදනය වනු ඇත. මින් අදහස් වන්නේ සන්නිවේදන අර්ථ ප්‍රකාශ කරන ලද අවස්ථාවෙන් සහ සන්දර්භයෙන් ද ඉවතට ගමන් කරන බවයි. ඒ අනුව අර්ථ යන්න කර්තෘ මූලික හෝ මනෝමූල ක්‍රමයෙන් බාහිර අර්ථ බහුලත්වයක් ද ගොඩ නංවයි. සන්නිවේදනාර්ථ හිතුවක්කාර ලෙස ගොඩනැගිය හැකි ඒවා නොවනු ඇත. සන්නිවේදනයේ දී මනෝ මූලික සහ විශය මූලික අභිලාශයන් ගෙන් තොරවන පණිවුඩයෙහි විශයීක සහ වාස්තවික අර්ථ ගොඩනැගෙන බව ද පැහැදිලි ය. ඒ අනුව කතෘත්වයෙන් මිදෙන සන්නිවේදනයට හෝ පඨිතය ට වාස්තවික හෝ විෂය මූලික පැවැත්මක් ද හිමිවනු ඇත. මේ අනුව පනිවුඩය යන්න ලොව මානව ක්‍රියාවලිය තුළ ශක්තිමත් ම ධාවක බලවේගය බවට පත්වන අතර එය තීරණාත්මක ක්‍රියාවලියක නිරත වී ඇති ආකාරය ද පැහැදිලි කරගත හැකි ය.

මේ අනුව ඩිජිටල් සන්නිවේදනය සහ මාධ්‍ය ක්‍රියාවලිය පශ්චාත් මිනිසෙකු (Post human) හෝ සංක්‍රාන්තික මිනිසෙකු (Trans human) නිර්මාණය කරනු දැකිය හැකි වන නිසා මානව විද්‍යාවෙහි විෂය ක්ෂේත්‍රයට ඒ පිළිබඳ සංකල්පීය සහ න්‍යායාත්මක එළඹුම කෙරෙහි ප්‍රබල වගකීමක් ද ගොඩ නැගෙන බව පැහැදිලි කරගත හැකි ය.

**References:**


Adams, T. L., Smith, S. A. (2008). *A Tribe by Any Other Name….In: Electronic Tribes: The Virtual Worlds of Geeks, Gamers, Shamans, and Scammers*, Adams, T. L., Smith, S. A. (eds.). University of Texas Press, Austin, p. 11-20.

Coleman, G. (2010). Ethnographic approaches to digital media. *Annual Review of Anthropology* **39**, 1-19.

Cool, J. (2012). *The mutual co-construction of online and on ground in Cyborganic: Making an Ethnography of networked social media speak to challenges of the post- human. In: Human no more: Digital subjectivities, unhuman subjects, and the end of Anthropology*, Whitehead, N. L., Wesch, M. (eds.). University Press of Colorado, Colorado, p. 11-32.

Fabian, J. (1991). Dilemmas of critical anthropology. *In Constructing knowledge: authority and critique in social science.* eds. L. Nencel and P. Pels, London: Sage.

Hart, K. (2000). *The Memory Bank: money in an unequal world.* Profile Books, London.

Hart, K. (2005). *The Hit Man's Dilemma: or business, personal and impersonal*. University of Chicago Press for Prickly Paradigm Press, Chicago

Hart, K. (2007). Money is always personal and impersonal. *Anthropology Today.* 23(5), 16-20

Horst, H. & D. Miller (eds) (2012). *Digital Anthropology.* London: Bloomsbury.

Geismar, H. (2018). *Museum object lessons for the digital age*. London: University College Press.

Madianou, M. & Miller, D. (2012). *Migration and new media: transnational families and polymedia.* London: Routledge.

Munn, N. 1973 Walbiri Iconography. Cornell: Cornell University Press

Myers, F. 1986 Pintupi Country, Pintupi Self. Washington: Smithsonian Institute Press

Pink, S., H. Horst, J. Postill, L. Hjorth, T. Lewis & J. Tacchi (2016). *Digital ethnography: principles and practice.* London: Sage.

Spiegel, L. 1992. Make Room for TV: Television and the Family Ideal in Postwar America Chicago: University of Chicago Press.